**කටාන ප්‍රාදේශීය සභාව**

**-------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**---------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන **201**9 මාර්තු **2**9 දින විගණනයට ඉදිරිපත් කර තිබූණද සංශෝධිත ගිණුම 2019 මැයි 06 දින විගණනයට ලැබී තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 28 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------- |
| (i) | පෙර වර්ෂයේ දී වැරදි ලෙස ගිණුම් ගත කර තිබුණු ලැබිය යුතු මුද්දර ගාස්තු රු.48,245,670 ක් නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ මුද්දර ආදායමට ගලපා තිබුණි. | සමුච්චිත අරමුදලට නිවැරදිව ගැලපීම් සිදු කළ යුතුවේ. | නිරවුල් කිරීම සඳහා මහා සභා අනුමැතිය වෙත යොමුකර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 03ක් සඳහා වැය කළ රු.2,605,466 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉටුකළ කර්මාන්ත ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුවේ. | එම කර්මාන්ත ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර ඇත. |
| (iii) | තොග වටිනාකම ලෙස රු.6,332,636 ක් වූ භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.8,599,237ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොග වටිනාකම ගිණුම්ගත කිරීම කළ යුතු වේ. | තොගයට අදාල වාර්ෂික ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කර ඇත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.20,680,413 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම්වල ශේෂ වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කල යුතු වේ. | 2019 අවසන් ගිණුමෙන් නිවැරදි කරමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කර්මාන්ත 11 ක් වෙනුවෙන් වසර 10 කට වඩා පැරණි ලැබිය යුතු රු.142.324 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වසර 10 කට වැඩි හිඟයක් බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්‍ෂණය | නිර්දේශ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.159,806,005 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාලව උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිපරිත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුය. | ගිණුම නිරවුල්කර උපලේඛන ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2017 මැයි 25 දිනැති අංක එල්ජීඩී/04/2017 දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | රුපියල් මිලියන 02 අභිබවා යන ඇස්තමේන්තු පළාත් ඉංජිනේරු (ගම්පහ) විසින් අනුමත කල යුතු වුවද පොල්ගාලවත්ත ප්‍රජා ශාලාවේ ඉදිකිරීමේ රු. **4,872,672** ක් වූ මුළු ඇස්තමේන්තුව අදියර 05 කට ඇස්තමේන්තු කර සභාවේ තාක්ෂණ නිලධාරීන් විසින් අනුමත කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර ඇස්තමේන්තු අනුමත කරගත යුතු වේ. | සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ගොඩනැගිලි සඳහා සම්පූර්ණ ඇස්තමේන්තුවක් සකස් කර දිස්ත්‍රික් ඉංජිනේරුතුමාගේ නිර්දේශය ලබා ගෙන අදාළ වර්ෂය තුල කොටස් වශයෙන් වෙන් කරමින් පිළිගත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකට යොමු කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 70,277,529 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.114,308,008 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ------ | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 36,100 | 46,838 | 46,990 | 28,392 | 34,469 | 35,336 | 34,314 | 30,054 |
| (ii) | කුලී | 1,155 | 923 | 932 | 29 | 1,593 | 1,022 | 1,045 | 8 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,530 | 1,266 | 1,948 | (682) | 980 | 1,187 | 1,187 | - |
| (iv) | වෙනත් ආදායම් | 155,220 | 155,220 | 98,088 | 57,131 | 190,026 | 179,686 | 71,298 | 14 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින ප්‍රාදේශීය සභාවේ රු. 5,000ට වැඩි හිඟ වරිපනම් ඒකක සංඛ්‍යාව 446 ක් වු අතර ඒවායේ වටිනාකම රු.4,974,340 ක් වී තිබුණි. මෙම හිඟ අය කර ගැනීමට හෝ දේපළ තහනම් කිරීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | වරිපනම් හිඟ අයකර ගැනීම කර අදාල අවස්ථාවන්හිදී දේපල තහනම් කිරීමට පියවර ගත යුතු වේ. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට කටාන, ආඩිඅම්බලම, රද්දොළුව හා දෙමංහන්දිය යන උප කාර්යාලවල පැවති වරිපනම් හිගයෙන් 2018 දෙසැම්බර් 31 වන විට අයකර ගෙන තිබු ප්‍රතිශතය පිළිවෙලින් සියයට 33, 47 , 47 හා 45 බැගින් විය. | හිඟ අයකර ගැනීමේ ප්‍රගතිය වර්ධනය කර ගත යුතු වේ. | හිඟ වරිපනම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.26,732,184 ක වරිපනම් හිගයෙන් 2019 මැයි 31 දින වන විට අයකර ගත් වටිනාකම රු.7,469,604 ක් වු අතර තව දුරටත් අයවිය යුතු හිගය රු.19,262,580 ක් විය. මින් දේපළ තහනම් කිරීමේ නියෝග නිකුත් කර තිබුණේ රු.8,348,793 ක් වු දේපල 2316 ක් සඳහා පමණි. | හිඟ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව පිළියෙළ කර තිබූ කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිරියේදී කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි. |

### (ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින ගිවිසුම්ගතව තිබූ සභා අරමුදලින් ආරම්භ කළ වටිනාකම රු.37,276,125ක් වූ ව්‍යාපෘති 09 ක් 2019 මැයි 31 දින වන විටත් නිම කර නොතිබූ අතර දෙපාර්තමේන්තු ක්‍රමය යටතේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කර තිබූ වටිනාකම රු.1,855,474 ක් වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඇස්තමේන්තු කර ඇති ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට එම ව්‍යාපෘතිවලින් කිහිපයක් වැඩ අවසන් කර ඇති අතර අනෙක් සියළු ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කර ඇති බව දන්වමි. |

### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට 2017 අංක 19 දරන | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගත යුතුවේ. | සංයුක්ත සැලැස්ම (2019 – 2023) තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක, දර්ශක හා පාදක දත්ත අනුව සකස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

තිරසර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැඳී පැවතුන ද සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක නිශ්චිතවම ඉදිරිපත් කර නොතිබූ අතර අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමන කිරීම සඳහා දර්ශක හඳුනා ගැනීම, පාදක දත්ත හඳුනා ගැනිම හා වාර්ෂික ඉලක්ක හඳුනා ගෙන නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පැවති මාර්ග තලනය භාවිතා කිරීමට හැකියාව තිබිය දී 2018 අප්‍රේල් 05 සිට මැයි 08 දක්වා වූ කාලය තුල දී දින 14ක් සඳහා කුලියට ගත් මාර්ග තලනයක් භාවිතා කිරීම හේතුවෙන් බාහිර පාර්ශවයකට රු.84,000ක් ගෙවා තිබුණි. | සභාව සතු වාහන තිබියදී කුලියට ගැනීම නොකළ යුතුවේ. | මෙම කාලය තුල සභාව සතු මාර්ග තලනය අපදාවට ලක් වී තිබූ බැවින් සේවයේ යොදවා නොමැති බව දන්වමි. |
| (ආ) | 2016 සිට 2018 දක්වා තෙවර්ෂය තුළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 2752 ක් ලැබී තිබූ අතර එයින් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 113 ක් සඳහා පමණි. අනුකූලතා සහතික ලබා නොගැනීම් හා මේ වන විට ඉදිකර තිබූ ගොඩනැගිලි සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක නිලධාරින් විසින් වරිපනම් බිල්කිරීම් සිදු නොවීම මත විශාල වරිපනම් ආදායමක් සභාවට අහිමිව තිබුණි. | ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. | අනුමැතිය ලද ඉදිකිරීම් සැලසුම් අදාළ වර්ෂය තුළ ම වැඩ අවසන් කර අනුකූලතා සහතිකය ලබා ගැනිමට නැවත ඉදිරිපත් වීමක් බොහෝ දුරට සිදු නොවන අතර බොහෝ අයදුම්කරුවන් බැංකු ණය මුදලෙහි අවසන් වාරිකය ලබා ගැනීමට ඉල්ලුම් කරයි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1998 වර්ෂයේදී පොදු නිවාස යෝජනා ක්‍රමයක් සඳහා සභාවට පවරා දි තිබූ කොටුගොඩවත්ත ඉඩම අදාල කාර්යය සඳහා යොදා ගෙන නොතිබූ අතර 1998 | අදාල අරමුණ සඳහා යෙදවීමට කටයුතු කල යුතු වේ. පොදු | ඉඩම් හා නිවාස නොමැති ජනතාව සඳහා නිවාස ඉදිකර දීමේ අරමුණින් නිවාස |

| | | | |
|---|---|---|---|
| | වසරේ සිට එහි පවුල් 56 ක් අනවසරයෙන් පදිංචිව තිබුණි. මෙම අයවලුන් සතුව අයිතිය තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පු නොමැතිව තිබියදී වරිපනම් තක්සේරු කර වරිපනම් අය කර තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2002 පෙබරවාරි 05 දිනැති ලිපියට අනුව මෙම ඉඩමේ පදිංචි පුද්ගලයින් 10 දෙනෙකුට එහි දක්වා ඇති මුදලකට විකිණීමට අනුමැතිය ලැබී තිබුණද පොදු කොටස සඳහා වෙන්කර තිබූ පර්චස් 24 න් කොටසක් එක් අයකුට විකුණා තිබූ අතර අනෙකුත් කොටස් 09 විකිණීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොටස පොදු කටයුතු සඳහා භාවිතා කිරීමට වෙන් කළ යුතුවේ. | යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා කටාන ප්‍රාදේශීය සභාව වෙත පවරා ගෙන ඉඩමේ පදිංචිකරුවන් පැරණි තක්සේරු මිලට පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇති අතර පවතින නීති රාමුව තුළ ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වමි. |
| (ආ) | ඉඩමේ අනුබෙදුම් පිඹුරුපත සභාව විසින් අනුමත කළ නොහැකි බව දන්වා තිබියදී දේපල වෙළඳ සමාගමක් විසින් කිඹුලාපිටිය අස්වැද්දුම ලිඳ මාවතේ පර්චස් 94 ක ඉඩමක් ප්‍රචාරයන් ලබාදෙමින් කට්ටි කර විකිණීම අරඹා තිබූ අතර ඒ සම්බන්ධයෙන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩම් අනුබෙදුම් පිඹුරුපත් සඳහා අනුමැතියකින් තොරව ඉදිරි ක්‍රියාමාර්ග සිදු නොකල යුතු වේ. | අනුබෙදුමට අනුමැතිය ලබා දෙන තෙක් මෙහි බිම් කොටස් විකිණීමෙන් වලකින ලෙස ඉල්ලුම්කරුට දන්වා ඇත. |

### 3.4 මානව සම්පත්කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාන මාරු, සේවය හැර යාම් හා විශ්‍රාම යාම් හේතුවෙන් නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.641,975ක් වූ ආපදා ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන අනුව සභාව සතු රු.385,040,395ක වටිනාකමැති ඉඩම් හා ගොඩනැගිලි සහ රු.63,224,405ක වටිනාකමැති මෝටර් රථ හා කරත්තවල පැවැත්ම 2018 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවිය. | ස්ථාවර වත්කම්වල පැවැත්ම සමීක්ෂණ මගින් තහවුරු කළ යුතුවේ. | එළඹෙන වර්ෂයේ සමීක්ෂණයේදී නිවැරදි කරන බව දන්වමි. |

## 3.6 ප්‍රසම්පාදනය

------------

### 3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී සභාවට අයත් පොල්ගාලවත්ත ප්‍රජාශාලාවේ ඉදිකිරීම් ආරම්භ කර තිබූ අතර තරඟකාරී අන්දමින් ප්‍රසම්පාදන කටයුතු සිදු නොකොට 2018 වර්ෂය සඳහා සභාවේ ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෙකු වෙත මෙහි ඉදිකිරීම් පවරා තිබුණි. 2014 සිට 2018 දක්වා වර්ෂ 05ක කාල සීමාවක් තුළ අදියර 5කදී රු.4,872,672ක වියදමක් දරා තිබුණ ද ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට වැඩ අවසන් කර නොතිබුණි. බිත්ති ආලේප කිරීම,ඉදිරිපස කොන්ක්‍රීට් කණුවේ වැඩ හා සිවිලිම සකස් කිරීම ආදි කාර්යයන් අසම්පූර්ණ තත්වයේ පැවති අතර නිම කර තිබූ වැඩවල අඩුපාඩු රැසක් පැවතුණි. | තරගකාරී අන්දමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර අපේක්ෂිත ප්‍රතිඵල ලබා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිකිරීමට අදාලව පැවති අඩුපාඩු කොන්ත්‍රාත්කරු ලවා නිවැරදි කරන ලදී. |
| (ආ) | දෙපාර්තමේන්තු ක්‍රමය යටතේ ක්‍රියාත්මක කර තිබූ හීනටියන දුටුගැමුණු මාවත කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර අවිනිශ්චිත වියදම් ලෙස මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 56 ක් හෙවත් රු.561,939 ක් ඇස්තමේන්තු කර තිබුණි. මාර්ගයේ දිග අඩි 300 ක් වන අතර ඒ අනුව සැපයිය යුතු ABC මිශ්‍රණය කියුබ් 8.9 ක් ඇස්තමේන්තු කර තිබුණද ගෙවීම් සඳහා පිළියෙල කර තිබූ මිණුම් වාර්තාව අනුව මාර්ගයේ දිග අඩි 219 ක් සඳහා ABC මිශ්‍රණය කියුබ් 6.50 ක් සපයා ඒ සඳහා ගෙවීම් කර තිබුණි. එහෙත් මේ සඳහා වන කොන්ක්‍රීට් මිශ්‍රණය අඩි 300 ක් වන මාර්ගය සඳහා කියුබ් 9 ක් ලෙස ඇස්තමේන්තු කර ගෙවීම් කර තිබූ හෙයින් ABC මිශ්‍රණය ඇතිරූ | මාර්ග කොන්ක්‍රීට් කිරීමේදී ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු කළ යුතු අතර පිළිතුරු ඉදිරිපත් කිරීමේදී සපයන තොරතුරු අඩු වැඩි වශයෙන් ඉදිරිපත් කල යුතුවේ. | කොන්ක්‍රීට් සඳහා අතුරු වාර්තා අමුණා ඇති අතර මෙවැනි අතපසුවීම් අවම කර ගැනීමට කටයුතු කරමි. |

මාර්ගයේ දිග හා කොන්ක්‍රීට් මිශ්‍රණය ඇතිරූ මාර්ගයේ දිග අතර අඩි 81 ක පරතරයක් පැවතිණි.පෞද්ගලික ආයතන විසින් සපයා තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහා එහි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**
**--------------------------------------------**

**4.1 අභ්‍යන්තර විගණනය**
**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා ගත යුතුය. | 2019 වර්ෂයේ එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |